**ඌව පළාත් සභාව - 2015**

----------------------------

ඌව පළාත් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

2.2.1 පළාත් සභා අරමුදල

----------------------

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2016 මාර්තු 10 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

2.2.2 අනෙකුත් ගිණුම්

------------------

සමාලෝචිත වර්ෂයට අදාළව 2016 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | විසර්ජන ගිණුම් | 29 | 29 | - |
| (ii) | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 29 | 29 | - |
| (iii) | ආදායම් ගිණුම් | 01 | 01 | - |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 09 | 09 | - |
| (v) | අරමුදල් ගිණුම් | 10 | 08 | 02 |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 02 | 01 | 01 |
| (vii) | පළාත් සභා මන්ත්‍රී අත්තිකාරම් ගිණුම | 01 | 01 | - |
| | | 81 | 78 | 03 |

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක එස්එස්/ඒඑස්/ඒඒ හා 2013 ජනවාරි 24 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර 2013 වර්ෂයේ සිට වාර්ෂික ගිණුම් උපචිත පදනම යටතේ පිළියෙල කලයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී ද ඌව පළාත් සභාව ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් සභාව ආරම්භයේ සිට මධ්‍යම රජය විසින් සහ පළාත් සභාව විසින් ස්ථාවර වත්කම් වෙනුවෙන් සැලකිය යුතු වියදමක් දරා තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා රු. 469,849,989 ක වියදම් දරා තිබුණි. කෙසේ වුවද, ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණු අතර, ගිණුම්කරණ ප්‍රතිපත්ති මඟින් ඒ පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

2.2.4 පළාත් සභා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

----------------------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂය තුළදී ඌව පළාත් මුද්‍රණාලයේ සේවයේ යෙදී සිටි ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා ගෙවූ වැටුප් රු. 3,327,451 ක් ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, සංස්කෘතික, සමාජ සුභසාධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබියදී

ඌව පළාත් මුද්‍රණාල අත්තිකාරම් ගිණුමේ ද වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල එම වියදම ද්විගණනය වී තිබුණි.

(ආ) කල්බදු පහසුකම් යටතේ මිලදීගත් වාහන සඳහා වාරික ගෙවීම වෙනුවෙන් 2015 වර්ෂයට අදාළ පොලී රු. 72,438 ක් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

2.2.5 විසර්ජන ගිණුම්

-----------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ඌව පළාත් ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ 2014 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය රු. 4,295,789 ක් 2015 ජනවාරි 01 දිනට රු. 2,625,529 ක් ලෙස දැක්වීමෙන් ජංගම නොවන වත්කම් රු. 1,670,260 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ඌව පළාත් ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ විසර්ජන ගිණුමේ අග්‍රිම ගිණුම් පිළිබඳ සාරාංශ වාර්තාවේ දැක්වෙන රු. 2,124,715 ක නොපියවූ අග්‍රිම ශේෂය 2015 වර්ෂයේ ජනවාරි 01 දිනට විසර්ජන ගිණුමේ අග්‍රිම ගිණුම් පිළිබඳ සාරාංශ වාර්තාවේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙනවිත් නොතිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ අග්‍රිම ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් විසර්ජන ගිණුමේ දක්වා තිබුණි.

(ඇ) ඌව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) කාර්යාලයේ විසර්ජන ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ එකතුව වූ රු. 9,806,218 ක් 2015 ජනවාරි 01 දිනට රු. 9,711,634 ක් ලෙස රු. 94,584 ක් අඩුවෙන් ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඈ) ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂය තුළ මුළු බැර කිරීම් රු. 8,753,012 ක් විය යුතු වුවද, විසර්ජන ගිණුම අනුව අග්‍රිම ගිණුම් පිළිබඳ සාරාංශ වාර්තාවේ රු. 9,202,040 ක් ලෙස රු. 449,028 ක් වැඩියෙන් දක්වා තිබුණි.

2.2.6 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එක් එක් ආයතනවලට අදාළ නොපියවූ අග්‍රිම ශේෂ හා අදාළ ආයතනවල ගිණුම් අනුව අනුරූපී ශේෂයන් අතර 2015 දෙසැම්බර් 31 දිනට වෙනස රු. 7,988,079 ක් විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ආයතන 03 ක පොදු තැන්පත් ගිණුම් ශේෂ හා එම ආයතනවල ගිණුම් අනුව එදිනට අනුරූපී ශේෂ අතර රු. 13,603,060 ක වෙනසක් තිබුණි.

(ඇ) ඌව පළාත් සභාවේ ආයතන 4 ක පළාත් රාජ්‍ය නිලධාරීන්ට ණය හා අත්තිකාරම් ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශවල එකතුව හා පාලන ගිණුම්වල ශේෂ අතර රු. 44,995,380 ක වෙනසක් තිබුණි.

(ඈ) සමූපකාර කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට පළාත් රාජ්‍ය නිලධාරීන්ට ණය හා අත්තිකාරම් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය රු. 1,654,259 ක් වුවත් පළාත් භාණ්ඩාගාර වාර්තා අනුව එම ශේෂය රු. 1,869,114 ක් වූයෙන් රු. 214,855 ක වෙනසක් තිබුණි.

(ඉ) සමූපකාර කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට ණය හා අත්තිකාරම් ගිණුමේ කේවල ණය ශේෂයන්ගේ දෙපාර්තමේන්තු පොත් අනුව එකතුව රු. 1,867,834 ක් වුවත් කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු. 1,770,284 ක් වූයෙන් රු. 97,550 ක වෙනසක් තිබුණි.

(ඊ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලයේ පොත් හා ලේඛන අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා 2015 වර්ෂයේදී ලබාදී තිබූ මුළු ප්‍රතිපාදන එකතුව රු. 35,092,572 ක් වුවද, පළාත් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන අනුව එම ප්‍රතිපාදන එකතුව රු. 38,576,000 ක් වූයෙන් රු. 3,483,428 ක වෙනසක් තිබුණි.

(උ) ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ විසර්ජන ගිණුමේ දැක්වෙන පොදු තැන්පතු ගිණුමේ ආරම්භක ශේෂය රු. 18,839 කින් වර්ෂයේ හර රු. 128,907 කින් වර්ෂයේ බැර රු. 70,102 කින් හා අවසන් ශේෂය රු. 68,644 කින් පළාත් සභා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල අනුරූපී අගයයන් අතර වෙනස්කම් තිබුණි.

(ඌ) සභා ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුමේ අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශය අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 11,847,539 ක් වුවද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. 10,915,204 ක් වූයෙන් රු. 932,335 ක වෙනසක් පැවතුනි.

(එ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලයේ විසර්ජන ගිණුම සමඟ ඉදිරිපත් කර ඇති අග්‍රිම ගිණුම පිළිබඳ සාරාංශ වාර්තාවේ දැක්වෙන අග්‍රිම ගිණුමේ ආරම්භක ශේෂය රු.4,418,699 කින් වර්ෂය තුළ මුළු හර කිරීම් රු. 352,265 කින් වර්ෂය තුළ මුළු බැර කිරීම් රු. 328,875 කින් හා අවසාන ශේෂය රු. 4,418,699 කින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූපී ශේෂයන් අතර වෙනසක් පැවතුනි.

(ඒ) පළාත් ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුමේ අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශයේ දැක්වෙන දෙපාර්තමේන්තු පොත් අනුව රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ආරම්භක ශේෂය රු.103,298 කින් වර්ෂය තුළ හර කිරීම් රු. 9,906,306 කින් වර්ෂයේ බැර කිරීම් රු. 1,172,311 කින් හා අවසාන ශේෂය රු. 959,095 කින් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ ශේෂයන් අතර වෙනසක් පැවතුනි.

(ඔ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම සමඟ ඉදිරිපත් කර තිබූ වාර්තාවේ ඇතුළත් අත්තිකාරම් ගිණුම් හා පොදු තැන්පතු ගිණුම සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශ වාර්තාවේ පොදු තැන්පතු ගිණුමේ වර්ෂය තුළ හර කිරීම් රු.4,198,677 කින් බැර කිරීම් රු. 4,461,177 කින් හා අවසාන ශේෂය රු. 8,659,854 කින් පළාත් භාණ්ඩාගාරයේ වාර්තා අතර වෙනසක් පැවතුනි.

(ඕ) පළාත් ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුමේ ඩී.ජී.එස්.ඒ.2 ආකෘතියේ මුදල් රෙගුලාසි 66 සහ 69 අනුව මාරුකිරීම් තීරුවේ එකතුව රු.1,312,092 ක් හා ඩී.ජී.එස්.ඒ.3 ආකෘතියේ එම තීරුවේ මුළු එකතුව රු. 12,000 ක් වූයෙන් රු.1,300,092 ක වෙනසක් තිබුණි.

(ක) ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ ණය ශේෂ පවරා ගැනීමේදී විධිමත්ව සටහන් නොකිරීම හා ඉන් පසුව එම ශේෂයන් යාවත්කාලීන නොකිරීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ කේවල ශේෂ වර්ගීකරණය සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ වර්ෂ අවසාන ශේෂය අතර රු. 300,192 ක වෙනසක් පැවතුනි.

(ග) ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ණය ශේෂ පවරා ගැනීමේදී විධිමත්ව සටහන් නොකිරීම හා ඉන්පසුව එම ශේෂයන් යාවත්කාලීන නොකිරීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු. 271,108,430 ක් හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය රු. 278,119,235 ක් වූයෙන් රු. 7,010,805 ක වෙනසක් පැවතුනි.

2.2.7 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වශයෙන් දක්වා ඇති බීජ අර්තාපල් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු. 40,869,376 ක් වර්ෂ 10 ට අධික කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

(ආ) වර්ෂ 10 කට පෙර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිදුවී තිබූ රු. 440,990 ක මුදල් අක්‍රමිකතාවය, 2015 දෙසැම්බර් 31 දිනට ද නිරවුල් නොවූ ශේෂයක් ලෙස ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2.2.8 අග්‍රිම ගිණුම්

-------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ පොත් අනුව පැවැති රු. 289,471 ක අග්‍රිම ශේෂයක් ඌව පළාත් සභාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ඌව පළාත් සභාවේ ආයතන 04 ක 2015 දෙසැම්බර් 31 දිනට පැවැති එකතුව රු.19,755,852 ක් වූ අග්‍රිම ශේෂ පළාත් මුදල් රීති 366.5 ප්‍රකාරව පළාත් භාණ්ඩාගාරය වෙත පියවා නොතිබුණි.

2.2.9 පොදු තැන්පත් ගිණුම්

------------------------

2015 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව ආයතන 21 කට අයත් එකතුව රු. 66,347,999 ක වසර 02 කට වැඩි කල් ඉකුත් වූ තැන්පත් ශේෂ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව නියාදනය කර නොතිබුණි.

2.2.10 පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

---------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 1,321,591,714 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 10 ට අධික කාලයක් නිරවුල් නොකර පවතින ගිණුම් 06 කට අයත් එකතුව රු. 3,881,161 ක් වූ හර ශේෂයක් හා ගිණුම් 03 කට අයත් එකතුව රු. 1,520,663 ක් වූ බැර ශේෂයක් විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් එක් එක් ආයතනයන්ට අදාළ පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් ශේෂ හා එම ආයතනවල ගිණුම් අනුව එදිනට අනුරූපී ශේෂ අතර රු. 461,008,732 ක වෙනසක් පැවතුනි.

(ඇ) ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය සඳහා වියදමෙහි උපරිම සීමාව රු.160,000,000 ක් වුවද, වර්ෂය තුළ මුළු හරකිරීම් රු.163,203,342 ක් වූයෙන් වියදමෙහි උපරිම සීමාව රු.3,203,342 කින් ඉක්මවා තිබුණි.

2.2.11 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

-------------------------------------------

බ/බදුළුදෙන විද්‍යාලයේ ගුණාත්මක යෙදවුම් ගිණුමට අදාල බැංකු ප්‍රකාශය අනුව 2011 නොවැම්බර් සිට 2012 පෙබරවාරි මාසය දක්වා බැංකු ගිණුමෙන් ගෙවා තිබූ රු.184,405 ක මුදල වැයකරන ලද ආකාරය සනාථ කර ගැනීම සඳහා සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

2.2.12 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහය | |
| (I) | XIX පරිච්ඡේදයේ 5 වගන්තිය | (i) උපලේඛනගත නිවාස හිමි නිලධාරින් 05 දෙනෙකුගෙන් 2014 ජුනි සිට 2015 දෙසැම්බර් දක්වා රු. 49,529 ක නිවාස කුලිය අඩුවෙන් අය කරගෙන තිබුණි.<br>(ii) සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සහ වනිතා කටයුතු අමාත්‍යාංශයේ නිලධාරියකුගෙන් නිවාස කුලිය අයකර නොතිබුණි. |
| (II) | XIX පරිච්ඡේදයේ 5.6 වගන්තිය | බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල් 31 ක ගුරු හා විදුහල්පති නිවාස වලින් ආර්ථික කුලිය තක්සේරු කර අයකිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (III) | XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය | පළාත් සභාවේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 08 ක මියගිය, විශ්‍රාම ගිය, සේවය හැරගිය හා වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 8,772,792 ක ණය ශේෂ අයකර ගෙන නොතිබුණි. |
| (ආ) | ඌව පළාත් සභා මුදල් රීති සංග්‍රහය | |
| (I) | 137, 138 රීති | මොනරාගල නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ නිලධාරින් 26 දෙනෙකුට 2015 වර්ෂයට අදාළ නිළ ඇඳුම් දීමනා ගෙවීම් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (II) | 215(3)(1) රීතිය | යම් වැය විෂයයක් යටතේ පවත්නා වර්ෂයේ ප්‍රතිපාදනයක කොටසක් ඉදිරි වර්ෂවල ගෙවීම් කිරීමේ අපේක්ෂාවෙන් සංචිත, පොදු තැන්පතු හෝ අවිනිශ්චිත ගිණුමට පැවරීම නොකළ යුතු වුවද, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය විසින් විදේශ ගමන් වියදම් දැරීම සඳහා පොදු තැන්පතු ගිණුමට රු. 23,804,052 ක ප්‍රතිපාදන මාරු කර තිබුණි. |
| (III) | 751 රීතිය | හපුතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට හා සායන මධ්‍යස්ථාන වලට 2014 දෙසැම්බර් 31 දින ලබාදුන් රු. 118,800 ක් වටිනා කොන්ක්‍රීට් බංකු 33 ක් 2015 දෙසැම්බර් 04 දින තෙක් සවිකිරීම් ලේඛන වලට ඇතුළත් කර නොතිබුණි. |

(IV) 751(1) රීතිය

මොනරාගල කලාප අධ්‍යාපන කාර්යාලයේ නොවිධිමත් අධ්‍යාපන පාඨමාලා සඳහා ඉකුත් වර්ෂයේ මාර්තු 17 දින ලැබුණු රු. 221,142 ක වටිනාකමැති ඉගෙනුම් උපකරණ 68 ක් තොග ලේඛන වල ඇතුළත් කර නොතිබුණි.

(ඇ) ජාතික අයවැය චක්‍රලේඛ

-------------------------

1/2014- 2014 ජනවාරි 01

ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 11 ක සේවක පුහුණු හා හැකියා වර්ධනය කිරීම සඳහා දරන ලද රු. 12,864,187 ක් වූ වියදම්, අංක 2401 දරන ප්‍රාග්ධන වැය විෂයට හර නොකර අංක 1102 දරන පුනරාවර්තන වැය විෂයට හර කර තිබුණි.

(ඈ) වෙනත් චක්‍රලේඛ

-------------------

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂගේ 2010/05/25 දිනැති අංක 01/2010 චක්‍රලේඛය

මොනරාගල නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ 2015 මාර්තු සිට අගෝස්තු දක්වා අනියම් සේවයේ නියුතු නිලධාරීන් වෙනුවෙන් ගෙවිය යුතු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායක මුදල් රු. 230,288 ක් ගෙවා නොතිබුණි.

(ඉ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2013 සැප්තැම්බර් 01 දිනැති අංක **Sec/2013/07** හා 2015 ජුලි 06 දිනැති අංක **Sec/2015/05** දරන චක්‍රලේඛය

ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 02 ක නිලධාරීන් 15 දෙනෙකුගෙන් රු. 221,602 ක් වූ උපයන විට බදු අඩුකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබූ බැවින් ඊට අදාළව රු. 22,160 ක දඩ මුදලක් ද ගෙවීමට සිදුවී තිබුණි.

3. ආදායම් කළමනාකරණය

---------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඌව පළාත් සභාවේ ඇස්තමේන්තුගත බදු ආදායම හා තථ්‍ය ආදායම අතර රු. 24,645,959 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

(ආ) ආදායම් විෂයයන් 02 ක ඇස්තමේන්තුගත ආදායමට වඩා තථ්‍ය ආදායමේ අඩුවීම සියයට 25 ක් හා සියයට 94 ක් වී තිබුණි.

(ඇ) පළාත් ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට පැවැති රු. 1,467,280 ක ආදායමක් පළාත් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඈ) ඒකාබද්ධ ආදායම් ගිණුමේ දැක්වෙන සමාලෝචිත වර්ෂය තුළ රැස්කරන ලද මුළු ශුද්ධ ආදායම පළාත් භාණ්ඩාගාරය, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය හා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුම් වල එකතුව සමඟ පිළිවෙලින් රු. 22,906 කින්, රු. 47,825 කින් හා රු. 29,282,512 කින් නොසැසඳුනි.

(ඉ) පළාත් ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුමේ මුද්දර බදු ආදායම රු. 1,130,282 කින් ව්‍යාපාර පිරිවැටුම් බදු ආදායම රු. 83,171 කින් හා උසාවි දඩ ආදායම රු. 10,011,447 කින් පළාත් භාණ්ඩාගාරයේ ආදායම් ලේඛන සමඟ නොසැසඳුනි.

(ඊ) පළාත් මුදල් රීති 142.1 ප්‍රකාරව ඌව පළාත් සභාවට ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් ආදායම තක්සේරු කර නොතිබුණි.

(ඩ) ඌව පරණගම අඹගස්දෝව මහජන බැංකු ශාඛාවට බදු දී තිබුණු ඉඩම සඳහා අය විය යුතු රු. 174,800 ක හිඟ බදු මුදලක් ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අය කර ගෙන නොතිබුණි.

(ඪ) තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දිගු කාලීන බදු ක්‍රමය යටතේ රජයේ ඉඩම් කොටසක් නේවාසික හා වාණිජ කටයුතු සඳහා පුද්ගලයකුට ලබාදී තිබුණි. ඉඩම් කොමසාරිස්ගේ අංක 4/10/15824 හා 1998 දෙසැම්බර් 17 දිනැති ලිපිය ප්‍රකාරව ඉඩමේ වර්තමාන වාණිජමය වටිනාකමින් සියයට 04 ක් වාර්ෂික බදු ලෙස අයකරගත යුතු බව දන්වා තිබියදී නොදියුණු වටිනාකම මත බදු අයකිරීම නිසා 1998 සැප්තැම්බර් 17 දින සිට 2015 සැප්තැම්බර් 17 දින දක්වා කාලය තුළ රු. 1,701,900 ක බදු මුදලක් අඩුවෙන් අයකරගෙන තිබුණි.

(ණ) මැදගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් රජයේ ඉඩමක් වාර්ෂික අවසර පත්‍රයක් මත නේවාසික කටයුතු සඳහා 2008 වර්ෂයේදී ලබාදී තිබුණු අතර, 2013 හා 2014 වර්ෂවලට අදාළ රු. 84,000 ක හිඟ බදු මුදල 2015 ජුලි 06 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(ත) රජයේ තක්සේරුකරු විසින් 2014 වර්ෂයේ මොනරාගල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය සතු නිවාස 18 ක ආර්ථික කුලිය තක්සේරු කර තිබුණ ද, එම නිල නිවාස වලින් නව තක්සේරු කුලී අය නොකිරීම නිසා රු. 203,235 ක ආදායමක් අහිමි වී තිබුණි.

4. මූල්‍ය සමාලෝචනය
-----------------------

4.1 මූල්‍ය ප්‍රතිඵලය
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 19,060,020,997 ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 15,720,806,957 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 3,339,214,040 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

4.2 ආදායම හා වියදම
-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ආදායම හා වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | ආදායම | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2015 | | | 2014 | | |
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පළාත් සභා විෂයයන්ට අදාළ ආදායම් | | | | | | |
| බදු ආදායම | 2,370,600,000 | 2,345,954,041 | (24,645,959) | 2,102,456,000 | 2,051,316,974 | (51,139,026) |
| බදු නොවන ආදායම | 234,400,000 | 381,233,297 | 146,833,297 | 277,544,000 | 545,164,047 | 267,620,047 |
| රජයේ ප්‍රදාන | 16,336,170,000 | 19,120,042,171 | 2,783,872,171 | 19,380,202,600 | 16,432,566,144 | (2,947,636,456) |
| එකතුව | 18,941,170,000 | 21,847,229,509 | 2,906,059,509 | 21,760,202,600 | 19,029,047,165 | (2,731,155,435) |

| | වියදම | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2015 | | | 2014 | | |
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 11,513,998,000 | 15,212,553,092 | 3,698,555,092 | 11,289,862,552 | 11,053,931,370 | 235,931,182 |
| අනෙකුත් පුනරාවර්තන | 3,673,002,000 | 3,378,081,841 | (294,920,159) | 3,716,408,098 | 2,815,402,656 | 901,005,442 |
| උප එකතුව | 15,187,000,000 | 18,590,634,933 | 3,403,634,933 | 15,006,270,650 | 13,869,334,026 | 1,136,936,624 |
| රාජ්‍ය ආයෝජන | 3,736,170,000 | 3,196,573,402 | (539,596,598) | 4,995,084,591 | 4,447,953,952 | 547,130,639 |
| එකතුව | 18,923,170,000 | 21,787,208,335 | 2,864,038,335 | 20,001,355,241 | 18,317,287,978 | 1,684,067,263 |

සමාලෝචිත වර්ෂය සඳහා මුළු වියදම රු. 21,787,208,335 ක් වූ අතර ඉන් සියයට 85 ක් පුනරාවර්තන වියදම් හා සියයට 15 ක් මූලධන වියදම් විය.

## 5. අරමුදල් ගිණුම්/අධිකාරි ගිණුම් හා වාණිජ අත්තිකාරම් ගිණුම්

### 5.1 අරමුදල් ගිණුම්

#### 5.1.1 ආණ්ඩුකාරවර අරමුදල

2015 වර්ෂයේ වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් වෙන් කර තිබූ රු. 1,500,000 ක් ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය විසින් ආණ්ඩුකාරවර අරමුදල වෙනුවෙන් වූ ඉතිරි කිරීමේ ගිණුමකට බැර කර තිබුණු අතර, 2015 දෙසැම්බර් 31 දින දක්වා එම මුදල අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් යොදවා නොතිබුණි.

#### 5.1.2 ප්‍රධාන අමාත්‍ය අරමුදල

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ රු. 2,500,000 ක් වටිනා ස්ථාවර තැන්පතු යලි ආයෝජනය කිරීමේදී අරමුදලට වාසි සහගත පොලී ආදායමක් උපයාගත හැකි පරිදි මූල්‍ය වෙළඳ පොල පොලී අනුපාතයන් පිළිබඳ විමසීම් කර එලදායි ලෙස ආයෝජනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන අමාත්‍ය අරමුදලෙන් ගෙවන ලද වෛද්‍යාධාර රු. 2,175,000 ක්, අධ්‍යාපන ආධාර රු. 874,000 ක් සහ දුගීභාවයට සහන සැලසීමේ ආධාර රු. 25,000 ක් අදාළ කාර්යයන් සඳහා යොදවන ලද බවට පසුවිපරම් කර නොතිබුණි.

#### 5.1.3 හදිසි අවස්ථා අරමුදල

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 20(3) වගන්තිය ප්‍රකාරව හදිසි අවස්ථා අරමුදලේ භාරය, අරමුදලට මුදල් ගෙවීම, මුදල් ඉවත්කර ගැනීම හා සම්බන්ධ හෝ ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් ආණ්ඩුකාරවරයා විසින් රීති සකස් කර නොතිබුණි.

5.1.4 හින්දු සංස්කෘතික කටයුතු පිළිබඳ අරමුදල

------------------------------------------------

1991 අංක 03 දරන හින්දු සංස්කෘතික කටයුතු පිළිබඳ ප්‍රඥප්තියේ 2 වන වගන්තිය අනුව පිහිටුවන ලද අරමුදලේ අරමුණු සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකරගෙන නොතිබුණි.

5.1.5 බෞද්ධ කටයුතු පිළිබඳ සංවර්ධන මණ්ඩලය

-------------------------------------------------

1993 අංක 01 දරන ඌව පළාතේ බෞද්ධ කටයුතු පිළිබඳ සංවර්ධන මණ්ඩලය (සංස්ථා ගත කිරීමේ) ප්‍රඥප්තියේ 04 වන වගන්තිය අනුව ඉටුකරගත යුතු පොදු පරමාර්ථ 10 කින් පරමාර්ථ 09 ක් සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකරගෙන නොතිබුණි.

5.1.6 නිවාස සංවර්ධන අරමුදල

----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සමුච්චිත අරමුදලේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය අනුව 2015 ජනවාරි 01 දිනට ශේෂය රු.7,383,831 ක් වුවද, 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදලේ ශේෂය රු.9,348,643 ක් වූයෙන් රු.1,964,812 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කර තිබූ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ප්‍රාදේශීය සංවර්ධන බැංකු ණය වාරික අයවීම් රු.1,110,546 ක් සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

5.1.7 සමුපකාර සංවර්ධන අරමුදල

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අවශ්‍ය ලෙජර් ගිණුම් පිළියෙල කර නොතිබූ බැවින් මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කර ඇති මූල්‍යමය අගයන්වල නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු. 547,079 ක උපකරණ වල වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ රු. 2,086,097 ක්වූ ආදායම් අතිරික්තය සමුපකාර සංවර්ධන අරමුදලට රු. 2,075,097 ක් ලෙස ගැලපීම නිසා සමුපකාර සංවර්ධන අරමුදල් ශේෂය රු. 11,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කර තිබූ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ රු. 765,630 ක් වටිනා ශේෂ හා ගනුදෙනු විගණනය කිරීම සඳහා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) 2011 අංක 03 දරන ඌව පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 43(ii) වගන්තිය ප්‍රකාරව සෑම ලියාපදිංචි කළ සමිතියක්ම වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට දහයකට වැඩි නොවන හා රු. 100 කට අඩු නොවන මුදලක් සමුපකාර අරමුදලට දායක මුදල් වශයෙන් වර්ෂයක් පාසා ගෙවිය යුතු වුවත්, ලියාපදිංචි සමිති 1256 න් සමිති 100 ක් පමණක් දායක මුදල් ගෙවා තිබුණි.

5.1.8 ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) බිබිල බස් නැවතුම්පල සංවර්ධන අරමුදල නමින් බදුල්ල මහජන බැංකුවේ පවතින රු.325,000 ක අරමුදල් ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් අනාවරණය කර නොතිබුණි.

(ආ) පළාත තුළ ධාවනය වන බස්රථ වලින් හා අන්තර් පළාත් බස්රථ වලින් 2015 සැප්තැම්බර් මස වන විට රු. 1,425,920 ක ලොග් පත්‍ර ගාස්තු හා පිවිසුම් ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(ඇ) බදුල්ල බස් නැවතුම්පළට අදාළව සිදුකරන ලද නියැදි පරීක්ෂාවට අනුව ලියාපදිංචි බස්රථ 178 ක කොන්දොස්තර බලපත්‍ර අළුත්කර නොතිබූ බැවින්, අධිකාරියට අහිමි වී ඇති ආදායම රු. 302,600 ක් වී තිබුණි.

(ඈ) 2015 වර්ෂය තුළදී අධිකාරිය විසින් නව මාර්ග බලපත්‍ර 53 ක් නිකුත් කර තිබුණ ද, නව මාර්ග බලපත්‍ර නිකුත් කිරිමේදී ඉකුත් වර්ෂවල මෙන්ම සමාලෝචිත වර්ෂයේද ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් තරඟකාරී මිල ගණන් යටතේ බලපත්‍ර නිකුත් කර ආදායම වැඩිකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඉ) 2008 අගෝස්තු 02 දින අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව අධිකාරිය යටතේ පාලනය වන බස්රථ වලට ප්‍රවේශ පත් යන්ත්‍ර ක්‍රමය ක්‍රියාත්මක කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ප්‍රවේශ පත් යන්ත්‍ර බස්රථ වලට හඳුන්වාදීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

(ඊ) නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

---

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2001 අංක 01 දරන ඌව පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තියේ 21 ඡේදය | සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අනුමත බඳවාගැනීමේ පටිපාටියක් ස්ථාපිත කර නොතිබුණි. |
| ඌව පළාත් සභා මුදල් රීති 431.7.2 | 2001 අංක 01 දරන ඌව පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තිය තුළ විගණනයට අදාළ ප්‍රතිපාදන ඇතුළත් කර නොතිබුණි. |

(උ) කළමනාකරණ අකාර්යක්ෂමතා

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) මාර්ගවල ධාවනය වන බස්රථවල ධාවන කාලය අඩුකිරීම මාර්ග සංවර්ධන ව්‍යාපෘති යටතේ මාර්ග කාපට් කිරීමේ එක් අරමුණක් වුවද, ඌව පළාත තුළ කාපට් කර ඇති එවැනි මාර්ගවල ධාවනය වන ඌව පළාත් මගී ප්‍රවාහන අධිකාරියේ ලියාපදිංචි බස්රථ වල ධාවන කාලය අඩුකිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) 1983 අංක 12 දරන සේවක පාරිතෝෂික පනතේ විධිවිධාන සහ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සේවක පාරිතෝෂික ගෙවීම් වෙනුවෙන් ඇතිවිය හැකි බැරකම් පියවීම සඳහා අරමුදලක් ස්ථාපිත කර නොතිබුණි.

5.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

----------------------------

5.2.1 වඩුපාසල් අත්තිකාරම් ගිණුම

--------------------------------

නිෂ්පාදනය සඳහා නිශ්චිතව හඳුනා ගත හැකි විදුලිය , ජලය හා ස්ථාන භාර උපදේශක වැටුප් වියදම් එකතුව රු. 8,555,576 ක් නිෂ්පාදන, වෙළඳ හා ලාභාලාභ ගිණුම හර කිරීම වෙනුවට කල්පිත ගාස්තු ගිණුමේ දක්වා තිබුණි.

5.2.2 ලුහු ඉංජිනේරු අත්තිකාරම් ගිණුම

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ලුහු ඉංජිනේරු වාණිජ අත්තිකාරම් ගිණුම සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය විග්‍රහය අනුව 2015 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය හා මුදල් පොතේ ශේෂය අතර රු.2,017,782 ක වෙනසක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී දරන ලද ස්ථාන භාර නිලධාරීන්ගේ හා මුරකරුවන්ගේ වැටුප් රු. 887,821 ක් හා ජල හා විදුලි වියදම් රු. 23,113 ක් වෙන් වෙන් වශයෙන් හඳුනා ගත හැකිව තිබියදී එම වියදම් නිෂ්පාදන හා ලාභාලාභ ගිණුමට හර කිරීම වෙනුවට කල්පිත ගාස්තු ගිණුමට ඇතුළත් කිරීම නිසා වර්ෂයේ ලාභය රු. 497,583 ක් වැඩියෙන් දැක්විණි.

5.2.3 දිසා යාන්ත්‍රික වැඩපළ සඳහා වූ අත්තිකාරම් ගිණුම

-------------------------------------------------------

වාර්ෂික මුදල් ප්‍රකාශය අනුව දිසා යාන්ත්‍රික වැඩපළ සඳහා වූ අත්තිකාරම් ගිණුම් කටයුත්තේ අවම බැර සීමාව රු. 40,000,000 ක් වුව ද, සමාලෝචිත වර්ෂය තුළ රැස් කළ ආදායම රු.27,647,654 ක් වූයෙන් රු. 12,352,346 කින් අවම බැර සීමාවට ළඟා වී නොතිබුණි.

5.2.4 කලාත්මක පේෂ කර්ම අත්තිකාරම් ගිණුම්

---------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ගෙවූ ජල හා විදුලි ගාස්තු රු. 42,509 ක් හා ස්ථාන භාර නිළධාරි හා මුර වැටුප් රු. 5,167,236 ක් නිෂ්පාදන ගිණුමේ කම්හල් පොදු කාර්ය පිරිවැය ගණනය කිරීමේ දී සැලකිල්ලට ගෙන නොතිබුණු අතර, එම වියදම් කල්පිත ගාස්තු ගිණුමට ඇතුළත් කර තිබුණි.

5.2.5 ඔක්කම්පිටිය බීජ ගොවිපලේ වාණිජ අත්තිකාරම් ගිණුම

-------------------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉදිරිපත් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව නොනිමි ද්‍රව්‍ය වල වටිනාකම මුළු නිෂ්පාදන පිරිවැය මත අගයකරන බවට සඳහන් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මාස 03 ක් වූ පැළ තවානේ වටිනාකම ගණනය කිරීම සඳහා ඇතුළත් කර තිබුණේ ඊට අදාළ කම්කරු ශ්‍රමය පමණි. ඒ අනුව පැළ තවානට ඇතුළත් වියයුතු පොහොර, බෙහෙත් හා ඇසුරුම් පැකට් ආදී ද්‍රව්‍ය වල වටිනාකම ඇතුළත් නොවීම නිසා ගණනය කර තිබූ රු. 811,069 ක් වූ පැළ තවානේ වටිනාකම නිවැරදි නොවීය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කර තිබූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළව පොදු ලෙජරයක් නඩත්තු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම තුළ ඇතුළත් වූ ප්‍රවර්තන වර්ෂයේ එකතුකිරීම්වල සත්‍ය වියදම රු. 3,517,685 ක් වුවද, එහි ඇස්තමේන්තු වටිනාකම වූ රු. 7,091,493 ක අගය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම නිසා ප්‍රවර්තන වර්ෂයේ ජංගම නොවන වත්කම් වල අගය රු. 3,573,808 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) භාවිතයෙන් ඉවත් කරන ලද, කාලපරිච්ඡේදය නිශ්චිතව හඳුනාගත නොහැකි ට්‍රැක්ටර් 09 ක්, බයිසිකල් 05 ක්, කොළ මඩින යන්ත්‍රයක් හා බීජ වී සැකසුම් යන්ත්‍රයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් ගොවිපල භූමියේ ගාල් කර තිබූ අතර එම වත්කම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) දැනට භාවිතා කරන ට්‍රැක්ටර් හා යන්ත්‍ර සූත්‍ර සඳහා යොදාගත නොහැකි අමතර කොටස් අයිතම් 1347 ක් ප්‍රයෝජනයට ගත නොහැකිව ගබඩා කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් එම අමතර කොටස් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම ගිණුමේ රු. 33,301,727 ක ශේෂයක් පැවති අතර, එම මුදල් විකල්ප ආයෝජනයන් සඳහා යෙදවීමට අවධානය යොමුකර නොතිබුණි.

5.2.6 බොරලන්ද සත්ව ගොවිපල වාණිජ අත්තිකාරම් ගිණුම
---------------------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ලෙජර් ගිණුම් හා උපයෝගී ලේඛන නඩත්තු කර නොතිබූ බැවින් පිළියෙල කර තිබූ මූල්‍ය ප්‍රකාශවල නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී සාධාරණ තහවුරුවක් ලබාගැනීමට නොහැකි විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට බොරලන්ද සත්ව ගොවිපලට අයත් ජංගම ගිණුමේ රු.2,787,730 ක ශේෂයක් හා ඉතිරිකිරීමේ ගිණුමේ රු. 8,545,234 ක ශේෂයක් පැවති අතර එම මුදල් විකල්ප ආයෝජනයන් සඳහා යෙදවීමට අවධානය යොමුකර නොතිබුණි.

5.2.7 බීජ අර්තාපල් ආනයනය කර බෙදාහැරීමේ විශේෂ අත්තිකාරම් ගිණුම
--------------------------------------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභා මුදල් රීති 500 විධිවිධාන ප්‍රකාරව මෙම අත්තිකාරම් ගිණුම පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පළාත් සභාවේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ආ) 2002 වර්ෂයේදී ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මහ කන්නය වගා කිරීම සඳහා බීජ අල ආනයනය කර ගොවීන් වෙත අලෙවි කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන සඳහා රු. 67,000,000 ක අත්තිකාරම් මුදලක් ප්‍රධාන ලේකම්ගෙන් ලබාගෙන තිබූ අතර 2015 දෙසැම්බර් 31 දින වනවිට එම අත්තිකාරම් මුදලින් රු.40,869,196 ක මුදලක් තවදුරටත් ප්‍රධාන ලේකම් වෙත පියවිය යුතුව තිබුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ නිලධාරීන්ගේ නොසැලකිල්ල හා සැලසුම් රහිත කටයුතු හේතුවෙන් පළාත් සභා අරමුදලට සිදුවී ඇති පාඩුව රු. 29,800,461 ක් විය.

(ඇ) කළුපුල්ලි රෝගය වැළඳී ප්‍රතික්ෂේපිත බීජ අල සඳහා නෙදර්ලන්තයේ ආයතනයකින් අයකර ගැනීමට ඇති රු. 4,893,741 ක මුදල ගිණුමට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) අත්තිකාරම් ගිණුමට අදාළව 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණයගැති ශේෂය රු. 11,058,794 ක් විය. 2010 වර්ෂයේ සිට අය නොවන ණයගැතියන් 429 දෙනෙකුගේ එකතුව රු. 9,876,451 ක ණය ශේෂ ඊට ඇතුළත්ව තිබුණි.

6. මෙහෙයුම් සමාලෝචනය

6.1 කාර්ය සාධනය

6.1.1 රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන සහ ඒවා උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රභවය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිවීම් | ඉතිරිවීම් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| අධ්‍යාපන | 1,243,564,765 | 1,126,036,618 | 117,528,147 | 09 |
| සෞඛ්‍ය | 565,446,753 | 536,354,888 | 29,091,865 | 05 |
| සමාජ සේවා | 28,647,000 | 18,539,286 | 10,107,714 | 35 |
| පළාත් මාර්ග ව්‍යාපෘතිය | 1,312,000,000 | 470,269,512 | 841,730,488 | 64 |
| වෙනත් | 1,211,601,464 | 1,045,373,099 | 166,228,365 | 14 |
| එකතුව | 4,361,259,982 | 3,196,573,403 | 1,164,686,579 | |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පළාත් මාර්ග ව්‍යාපෘතිය සඳහා වෙන්කළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 64 ක් උපයෝජනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල සමාජ සේවා සඳහා ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 35 ක්, වෙනත් යටතේ සියයට 14 ක්, අධ්‍යාපනය සඳහා සියයට 09 ක් හා සෞඛ්‍ය සඳහා සියයට 05 ක් වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

6.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා වූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රු.මිලියන 1006 ක ඇස්තමේන්තු අගයකට වූ ව්‍යාපෘති යෝජනා 1192 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව ව්‍යාපෘති වැඩ යෝජනාවල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| ව්‍යාපෘති විස්තර | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා |
|---|---|---|---|
| සම්පූර්ණයෙන් නිමකළ | 1043 | 106 | 1149 |
| 50% ට වඩා වැඩියෙන් නිමකළ | 17 | - | 17 |
| 50% ට වඩා අඩුවෙන් නිමකළ | 18 | - | 18 |
| ආරම්භකර නොතිබූ | 08 | - | 08 |
| එකතුව | 1086 | 106 | 1192 |

6.1.3 විභාග ප්‍රතිඵල

---------------

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මූලික අරමුණු ඉටුකිරීම වෙනුවෙන් එම දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ 2015 වර්ෂයේදී රු. 10,408,520,810 ක් වැය කර තිබූ අතර, ඉන් වැය විෂයයන් 06 ක් යටතේ රු. 209,117,773 ක් ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන තත්ත්ව යෙදවුම් සඳහා වැයකර තිබුණි. කෙසේ වුවද, විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා අවශ්‍ය විෂයානුබද්ධ ප්‍රතිඵල සමාලෝචනයක් සිදුවී නොතිබුණු අතර, ප්‍රතිඵල ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනාගත් බවට සාක්ෂි නොතිබුණි. 2015 වර්ෂයේ විභාග ප්‍රතිඵල පිළිබඳ සාරාංශගත තොරතුරු පහත දැක්වේ.

| විභාගය | ඉදිරිපත් වූ සංඛ්‍යාව | සමත් වූ සංඛ්‍යාව | අසමත් මුළු සංඛ්‍යාව | සියළු විෂයයන් අසමත් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 5 වසර ශිෂ්‍යත්වය | 22373 | 18350 | 4023 | - |
| අ.පො.ස.(සා.පෙළ)* | 18269 | 12057 | 6212 | 748 |
| අ.පො.ස.(උ.පෙළ)* | 13762 | 8731 | 5031 | 1083 |

* සමස්ථ ප්‍රතිඵල අනුව ඌව පළාතට අ.පො.ස.(සා.පෙළ) සඳහා 7 වැනි ස්ථානය ද, අ.පො.ස.(උ.පෙළ) විද්‍යා අංශයෙන් 8 වන ස්ථානය ද, භෞතික විද්‍යා අංශයෙන් 7 වන ස්ථානය ද, වාණිජ අංශයෙන් 9 වන ස්ථානය ද, කලා අංශයෙන් 1 වන ස්ථානය ද, ඉංජිනේරු තාක්ෂණ අංශයෙන් 4 වන ස්ථානය ද, ජීව තාක්ෂණ අංශයෙන් 4 වන ස්ථානය ද හිමි වී තිබුණු අතර, 5 වසර ශිෂ්‍යත්වය සඳහා 6 වැනි ස්ථානයත් හිමි වී තිබුණි.

* පස්සර අධ්‍යාපන කලාපයේ පාසැල් 04 ක 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂයයෙන් කිසිදු ශිෂ්‍යයෙකු සමත් වී නොතිබුණු අතර, 2014 වර්ෂයේ පවත්වන ලද අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව කලාපයේ කිසිදු පාසැලකින් එක් ශිෂ්‍යයෙකුවත් විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට සුදුසුකම් ලබා නොතිබුණි.

* පස්සර කලාප අධ්‍යාපන කාර්යාලය විසින් 2015 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අනුමත කරන ලද වැඩ සටහන් 30 ක්, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල ඉහල නැංවීමේ වැඩ සටහන් 09 ක් හා අ.පො.ස.(උසස් පෙළ) ඉලක්ක කරගත් වැඩ සටහන් 02 ක් 2015 නොවැම්බර් 23 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

* 5 වසර ශිෂ්‍යත්ව විභාගයේදී හා අ.පො.ස (සා.පෙළ) විභාගයේදී දිවයිනේ දිස්ත්‍රික්ක අනුව සමස්ථ මට්ටම පහත දැක්වෙන පරිදි විය.

| විභාගය | සමස්ථ ප්‍රතිඵල දිස්ත්‍රික්ක අනුව ලබාගෙන ඇති ස්ථාන | |
|---|---|---|
| | බදුල්ල දිස්ත්‍රික්කය | මොනරාගල දිස්ත්‍රික්කය |
| 5 වසර ශිෂ්‍යත්වය | 22 | 23 |
| අ.පො.ස (සා.පෙළ) | 16 | 22 |

6.1.4 අනෙකුත් කාර්ය සාධනය

---------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ඌව පළාත් සභාවේ කාර්ය පටිපාටි රීති සංග්‍රහයේ 74 වන රීතිය ප්‍රකාරව පිහිටුවන ලද කාරක සභා 07 ක් VI වන පළාත් සභාව ආරම්භ කරන ලද 2014 සැප්තැම්බර් මස සිට 2016 මාර්තු මාසය දක්වා වූ කාලය තුළදී ක්‍රියාකාරී තත්ත්වයෙන් නොපැතුනි. මේ නිසා 2015 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාත්මක සැලැස්ම අනුව අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කාරක සභා වලින් අපේක්ෂිත දායකත්වය ලැබී නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| | කාරක සභාවේ නම | අදාළ කාලය තුළ රැස්වූ වාර ගණන |
|---|---|---|
| I. | පළාත් අරමුදල් පිළිබඳ ගිණුම් කාරක සභාව | නැත |
| II. | යෝජිත ව්‍යවස්ථා සහ රීති පිළිබඳ කාරක සභාව | නැත |
| III. | සභාවේ වැඩ කටයුතු පිළිබඳ කාරක සභාව | නැත |
| IV. | කාර්ය පරිපාටි, රීති පිළිබඳ කාරක සභාව | නැත |
| V. | මහා කාරක සභාව | නැත |
| VI. | පොදු පහසුකම් හා වරප්‍රසාද පිළිබඳ කාරක සභාව | 01 |
| VII. | මහජන පෙත්සම් කාරක සභාව | 01 |

(ආ) ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන,නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, සංස්කෘතික, සමාජ සුභ සාධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය හා භෞතික ප්‍රගතිය දැක්වෙන ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ඇ) පළාත් සභා මුදල් රීති 6.2.5 ප්‍රකාරව වාර්ෂික මුදල් ප්‍රකාශයේ අරමුණු හා කාර්යයන් දැක්විය යුතු වුවද, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) කාර්යාලය විසින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු හා කාර්යයන් හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයට අයත් තත්ත්ව පාලන රසායනාගාරය තුළදී තත්ත්ව පරීක්ෂණ වර්ග 14 ක් සිදුකිරීමේ හැකියාව පැවති අතර, බාහිර ආයතන විසින් පරීක්ෂණ සඳහා කරනු ලබන ඉල්ලීම් ලේඛනගත කිරීමකින් තොරව රසායනාගාර ඉංජිනේරුවරයා භාරයට ගෙන පරීක්ෂණයට භාජනය කර වාර්තා නිකුත් කරන බව නිරීක්ෂණය විය. රසායනාගාර ඉංජිනේරුවරයාගේ අභිමතය පරිදි පරීක්ෂණ මිලගණන් තීරණය කර තිබූ අතර, තීරණය කරන ලද මිලගණන් ඌව පළාත් සභාව විසින් අනුමත කර නොතිබුණි. තත්ත්ව පාලන රසායනාගාරයට අදාළ භෞතික හා මානව සම්පත් උපයෝගී කරගෙන ඌව පළාත් සභාවට වැඩි ආදායමක් උපයාගැනීමට හැකිවන ආකාරයට විධිමත් ක්‍රියාපටිපාටියක් සැලසුම් කිරීමට අවධානය යොමුකර නොතිබුණි.

(ඉ) බණ්ඩාරවෙල දිසා රෝහලේ විශේෂ හා ආබාධිත දරුවන් වෙනුවෙන් වූ සායනය සඳහා විශේෂඥ වෛද්‍යවරයෙකු නොමැති වීමෙන් අදාළ ඒකකය වෙනුවෙන් යොදවා ඇති උපකරණ නිෂ්කාර්යව පැවතුනි.

(ඊ) පළාත් මුදල් රීති 133.5.13 ප්‍රකාරව නව තාක්ෂණය හා ශිල්පීය ක්‍රම හඳුන්වාදීමට අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(උ) 2010, 2011 හා 2012 වර්ෂ වල ඌව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, කුඩා වැවිලි ව්‍යවසාය සංවර්ධන පදනම සහ බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වසම් 03 ක රබර් වගා කරුවන් 261 දෙනෙකු වෙත ඉඩම් අක්කර 520 ක් බෙදා දී තිබුණි. 2015 ඔක්තෝබර් 23 දින වන විටත් වගාකරුවන් අතරින් 14 දෙනෙකු

පමණක් රබර් වගා කටයුතු සිදුකරන බව අනාවරණය වූ අතර, රබර් වගාව ස්ථාපිත කිරීමේ අරමුණ සාර්ථක වී නොමැති බව නිරීක්ෂණය විය.

(ඌ) බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උපමාන පාදක වැඩසටහන යටතේ මිලදී ගෙන තිබූ වටිනාකම හෙළිදරව් නොවූ ප්ලාස්ටික් පුටු 48 ක් හා 2014 හා 2015 වර්ෂවල මිලදී ගෙන තිබූ රු. 444,229 ක් වටිනා භාණ්ඩ ඒකක 219 ක් 2015 දෙසැම්බර් 04 දින වන විටත් අදාළ ප්‍රතිලාභීන්ට බෙදා නොහැර ගබඩා කර තිබුණි.

6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තීරක ප්‍රදානයෙන් පසු ණයගැතියන් හිඟ ණය මුදල් නොගෙවීමෙන් දින 30 ක් ඉක්ම ගිය පසු අදාළ සමුපකාර සමිති මඟින් උසාවිගත කිරීම සඳහා ඉල්ලීම් ආකෘති සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇතත් අදාළ නිලධාරීන් ඒ සඳහා ඉදිරි පියවර නොගැනීමෙන් අයකර ගත යුතු ණය වල එකතුව රු. 8,183,955 ක්ව තිබුණි. මෙ සම්බන්ධයෙන් ඌව පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ 2012 ජනවාරි 02 දිනැති අංක 2012/01 අභ්‍යන්තර චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සී/ස උඩපළාත විවිධ සේවා සමුපකාර සමිතියේ 2014 වර්ෂය අවසන් ගිණුමේ සඳහන් 1972 වර්ෂයේ පැවත එන රු. 1,308,681 ක් වූ අක්‍රීය තීරක ණයගැති ශේෂ 96 ක් සම්බන්ධයෙන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) වැලිමඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන් සේවය කළ නිලධාරියෙකු 2012 පෙබරවාරි 15 දින සිට ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර තිබුණ ද, එදින සිට 2015 දෙසැම්බර් මාසය දක්වා රු. 2,174,708 ක් වූ වැටුප් හා දීමනා වැලිමඩ කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ගෙවා තිබුණි.

(ඈ) 2001 මාර්තු 28 දිනැති පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 01/2001 දරන චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභා මන්ත්‍රීවරයෙකු මන්ත්‍රීධුරය අත්හරින අවස්ථාවක පළාත් සභාවට අයවිය යුතු සියලු ණය මුදල් එකවර සම්පූර්ණයෙන් අයකර ගතයුතුව තිබුණි. 2015 වර්ෂයේදී පාර්ලිමේන්තුවට තේරී පත්වූ පළාත් සභා මන්ත්‍රීවරුන් පස් දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 1,003,100 ක් වූ ණය ඌව පළාත් සභා ලේකම් කාර්යාලය විසින් එම විධිවිධාන ප්‍රකාරව එකවර අයකර ගෙන නොතිබුණි. මීට අමතරව පළාත් සභා සභිකධුරයකට අතර මැද කාලයකදී පත්වන මන්ත්‍රීවරයෙකුට ණය පහසුකම් ලබාගැනීම සඳහා හිමිකම් ඇත්තේ මන්ත්‍රීවරයා ධූරය ලබන දිනය හා පළාත් සභාවේ කාලය අහෝසි වන දිනය දක්වා කාලය සම්පූර්ණ ණය මුදලට අනුපාතිකව ගණන් බැලීමෙනි. ඊට පටහැනිව ඌව පළාත් සභා ලේකම් කාර්යාලය විසින් මන්ත්‍රීවරුන් දෙදෙනෙකු සඳහා එකතුව රු.100,000 ක් වූ ණය මුදල් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් බැහැරට ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 3352 ගේ රු. 57,373,463 ක ණය ශේෂ හා ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 934 ගේ රු.24,779,547 ක ණය ශේෂ ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ 2004 ජනවාරි 08 දිනැති අංක 2004/01 දරන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව නිරවුල් කර නොතිබුණි.

(ඊ) ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන,නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, සංස්කෘතික, සමාජ සුභසාධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශයෙන් ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 33 දෙනෙකුගේ එකතුව රු. 1,361,554 ක් වූ ණය ශේෂයන් හා ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 24 දෙනෙකුගේ රු. 606,221 ක් වූ ණය ශේෂයන් ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ 2004 ජනවාරි 08 දිනැති අංක 2004/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව නිරවුල් කර නොතිබුණි.

(උ) ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ 2004 ජනවාරි 08 දිනැති අංක 2004/01 දරන චක්‍රලේඛය, ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදය සහ පළාත් මුදල් රීති 485(4) ප්‍රකාරව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලයේ 1995 වර්ෂයේ සිට බැහැරට ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 31 දෙනෙකුගේ රු. 1,399,912 ක් වූ ණය ශේෂ අයකර ගෙන නොතිබුණි. 1994 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුවට බැහැරින් ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 32 දෙනෙකුගේ රු. 1,402,858 ක් වූ ණය ශේෂ 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඌ) ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 ජුනි 29 දිනැති අංක EST/7/TRAVEL/06/3030 දරන ලිපියට පටහැනිව මොනරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වැඩබලන ගණකාධිකාරිවරයාට 2015 ජනවාරි සිට අගෝස්තු දක්වා කාල පරිච්ඡේදයට අදාළව රු. 32,500 ක සංයුක්ත දීමනා ගෙවා තිබුණි.

(එ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 13/2010 හා 2010 දෙසැම්බර් 16 දිනැති චක්‍රලේඛයේ 04 වගන්තිය සහ අංක 03/2013 හා 2013 සැප්තැම්බර් මස 20 දිනැති චක්‍රලේඛයේ 06 වන වගන්තිය ප්‍රකාරව මිය ගිය අයගේ වැන්දඹු අනත්දරු හිමි දරුවන්ගේ වයස අවුරුදු 26 සම්පූර්ණ වීමෙන් පසු ගෙවීම් නතර කළ යුතුව තිබුණි. යැපෙන්නන් ලෙස නම් කර ඇති එක් යැපෙන්නෙකුගේ වයස 2013 අගෝස්තු 19 දිනට අවුරුදු 26 සම්පූර්ණ වී ඇතත් එදින සිට 2015 නොවැම්බර් දක්වා රු. 355,841 ක මුදලක් යැපීම් දීමනා වශයෙන් මොනරාගල කලාප අධ්‍යාපන කාර්යාලය විසින් වැඩිපුර ගෙවා තිබුණි.

(ඒ) ගොවිජන කාරක සභා ගොඩනැගිලි වල කෘෂිකර්ම උපදේශක කාර්යාල පවත්වාගෙන යාම වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. 218,784 ක කුලිය මොනරාගල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් නිරවුල් කර නොතිබුණි.

(ඔ) 2004 ජනවාරි 08 දිනැති අංක 2014/1 දරන ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ කාර්යාල චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාවේ එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වලින් ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ ගිණුම් සාරාංශ මඟින් නිරවුල් කළයුතු වුවත්, රු. 531,149 ක් වූ අක්‍රීය ණය ශේෂ 04 ක් හා රු. 1,246,499 ක් වටිනා ණයගැති ශේෂ 24 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද පළාත් සභාවෙන් වෙනත් පළාත් සභා හා මධ්‍යම රජයේ ආයතන සඳහා ස්ථාන මාරුවී ගිය හා ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ එකවර අයකරගත යුතු වුවත්, රු. 26,303,832 ක් වටිනා ණය හිමි ශේෂ 838 ක් හා රු. 52,695,291 ක් වටිනා ණයගැති ශේෂ 1049 ක් ඒ අනුව නිරවුල් කර නොතිබුණි.

(ඕ) ඔක්කම්පිටිය බීජ ගොවිපල විසින් 2014 වර්ෂය සඳහා උපයා තිබූ රු. 15,188,767 ක ලාභය 2015 වර්ෂය තුළදී ඌව පළාත් සභාව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක ඌව පළාතේ වඩු පුහුණු මධ්‍යස්ථාන වලට 2015 වර්ෂයේ දී අභ්‍යාසලාභීන් 48 දෙනෙකු බඳවා ගෙන තිබුණ ද, පුහුණුව සම්පූර්ණ කර තිබුණේ අභ්‍යාසලාභීන් 19 දෙනෙකු පමණි.

(ආ) වැලිමඩ අධ්‍යාපන කලාපයේ පාසැල්වල 2015 ඔක්තෝබර් 30 දිනට හිඟ විදුලි බිල්පත් ශේෂය රු. 833,437 ක් වූ අතර, පාසැල් 16 ක විදුලිය අසාමාන්‍ය ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට වැටුප් පත්‍රිකා වලින් අඩුකරගෙන තිබූ රු. 6,893,458 ක් සහ 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ පාරිතෝෂිකවලින් අඩුකරගන්නා ලද රු.2,580,918 ක් වශයෙන් එකතුව

රු. 9,474,376 ක් බදුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) බදුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් අධ්‍යාපන සංවර්ධන කේන්ද්‍රයේ ගොඩනැගිල්ලක 2000 මාර්තු 16 දින සිට බාහිර පාර්ශවයන් විසින් එක් සිසුවකුගෙන් රු. 850 ක් බැගින් අයකරමින් සිසුන් 64 දෙනෙකුගෙන් සමන්විත පෙර පාසලක් පවත්වාගෙන යමින් තිබූ අතර මේ පිළිබඳ විධිමත් ක්‍රියාමාර්ග නොගෙන රජයේ සම්පත් අවිධිමත් පරිහරණයට ඉඩ සලසා තිබුණි.

(ඉ) විශේෂ සංවර්ධන ව්‍යාපෘති යටතේ ඌව පළාත් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් 2014 ජුනි මාසයේදී ප්‍රතිලාභීන්ට බෙදාහැරීම සඳහා බිබිල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ලබාදී තිබූ ද්‍රව්‍ය හා උපකරණ අයිතම් 304 ක් නැවත 2014 ජුලි 18 වන දින පළාත් සභාවට භාරදී තිබුණි. පළාත් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2014 මැයි 29 දිනැති ලිපියෙහි 03 ඡේදය ප්‍රකාරව ලබාදී ඇති ද්‍රව්‍ය හා උපකරණ 2014 ජුනි මාසයට පෙර බෙදාදී අවසන් කළයුතු බව දන්වා තිබුණ ද, 2015 ඔක්තෝබර් 19 වන දිනය වන විටත් උපකරණ 1188 ක් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ඊ) රාජ්‍ය හා පෞද්ගලික ඇණවුම් සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීම, යකඩ භාණ්ඩ හා දොර ජනෙල් සෑදීම පිළිබඳ ආධුනිකයන්ට පුහුණුවක් ලබාදීම ලුහු ඉංජිනේරු අභ්‍යාස ආයතන ආරම්භ කිරීමේ මූලික අරමුණ වුවත්, 2015 වර්ෂය සඳහා බෙරගල ලුහු ඉංජිනේරු ආයතනයට පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් දෙදෙනෙක් පමණක් බඳවා ගෙන තිබුණ අතර මැදගම ඉංජිනේරු ආයතනයට අභ්‍යාසලාභීන් බඳවා ගෙන නොතිබුණි.

(උ) පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් ගබඩාව පිළිබඳ නියැදි පරීක්ෂාවකදී විෂයන් 09 කට අදාළ රු. 228,525 ක් වටිනා ගබඩා භාණ්ඩ අතිරික්තයක් අනාවරණය විය.

(ඌ) පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2015 ජුලි 22 දින රු.46,360 ක් වටිනා ප්ලාස්ටික් මේස 08 ක් මිලදීගෙන ඇති බව ගබඩා තොග පොතෙහි සටහන් කර තිබුණ ද, භෞතිකව පරීක්ෂා කිරීමේදී රු. 28,975 ක් වටිනා මේස 05 ක් අඩුවෙන් සපයා තිබුණි.

6.4 වත්කම් කළමනාකරණය

---------------------------

2015 නොවැම්බර් 06 දින බඩල්කුඹුර ප්‍රාදේශීය රෝහලේ ඖෂධ ගබඩාව පරීක්ෂාවේ දී ඖෂධ වර්ග 13 කට අදාළ ඒකක 75,132 ක ඌණතාවයක් හා ඒකක 7010 ක අතිරික්තයක් තිබුණු අතර 2015 වර්ෂයේ මැයි සිට නොවැම්බර් අතර, කාලපරිච්ඡේදය තුළ දී ගබඩාවට ලැබුණු ඖෂධ තොග වර්ග 03 කට අදාළ ඒකක 36000 ක් කල් ඉකුත් වීමට ආසන්නව තිබූ බව නිරීක්ෂණය විය

6.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබාදී තිබූ කර්මාන්ත පරිපාලන වියදම් වලින් රු. 151,500 ක් ඌව පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් විදේශ සංචාර වියදම් සඳහා යොදා ගෙන තිබුණි.

(ආ) 2011 ජුලි 06 දිනැති අංක FC/PSDG & CBG/Circular/2011/1 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වාහන මිලදී ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ හා මුදල් කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්,

සංස්කෘතික, සමාජ සුභසාධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් රු. 9,400,000 ක් වැයකර BMW වර්ගයේ මෝටර් රථයක් මිලදී ගෙන තිබුණි. මෙම වාහනය මිලදී ගැනීම හා සම්බන්ධ අනුමත පිරිවිතරයන් අතර වෙනස්කම් 07 ක් පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂවරයා විසින් වාර්තා කර තිබුණි.

(ඇ) බ/වැලිමඩ විජය විද්‍යාලයේ පාසැල් සංවර්ධන සමිති ගිණුමෙන් වැඩ, සැපයුම් හා සේවාවන් ඉටුකර ගැනීමේදී අවස්ථා 06 කදී රු. 184,286 ක් වැයකර මිලකැඳවීමකින් තොරව ද, අවස්ථා 09 කදී රු. 561,445 ක් ගෙවීම් අනුමත කිරීමකින් හා වියදම් සහතික කිරීමකින් තොරව ද, එක් අවස්ථාවකදී රු. 170,600 ක් වැයකර විධිමත් තාක්ෂණ ඇගයීමකින් තොරව ද කටයුතු කර තිබුණි.

(ඈ) 2011 මැයි 11 දිනැති අංක පීඑල්/6/11/3ධූ1 දරන පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය අනුව පළාත් සභා නායක, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, විපක්ෂ නායක හා විපක්ෂයේ ප්‍රධාන සංවිධායක යන අනුමත නොවන ධූරධාරීන්ගේ වැටුප්, දීමනා හා පහසුකම් පිළිබඳ ඉදිරි කටයුතු සිදු නොකරන ලෙස දැනුම් දී තිබුණි. එම උපදෙස් වලට හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 25 වන වගන්තියට පටහැනිව අනුමත නොවූ ධූරධාරීන් තිදෙනෙකු සඳහා 2014 සැප්තැම්බර් මස සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු. 6,992,258 ක් සභා ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි.

6.6 දෘශ්‍ය අක්‍රමිකතා

------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) බ/බදුළුදෙන විද්‍යාලයේ ගුණාත්මක යෙදවුම් ගිණුමේ රු. 337,173 ක මුදලක් විදුහල්පතිවරයා විසින් පෞද්ගලික ප්‍රයෝජනයට ගෙන තිබුණි.

(ආ) කතරගම ප්‍රාදේශීය රෝහලේ 2015 ජනවාරි මස සිට ඔක්තෝබර් මස දක්වා කිලිටි රෙදි සේදීම වෙනුවෙන් ගෙවීම් කිරීමේදී රු.133,325 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවා තිබුණි.

6.7 අරමුදල් ඌන උපයෝජනය

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මහියංගනය අධ්‍යාපන කලාපය තුළ පාසැල්වල ගුණාත්මක යෙදවුම් මුදල් රු. 25,468,762 ක් අදාළ කාර්යය සඳහා යොදා නොගෙන කලාප අධ්‍යාපන කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි.

(ආ) 2012 වර්ෂයේ සිට 2014 දක්වා කාලය තුළ පාසැල්වල ගුණාත්මක යෙදවුම් මුදල් ඉතිරිවීම් රු. 6,787,379 ක් බදුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන පසුව කාර්යාලයීය අත්මුදල් කාර්යයන් සඳහා වැයකර තිබුණි.

(ඇ) දෙමාපිය රැකවරණය අහිමි දරුවන්ගේ අධ්‍යාපන මට්ටම ඉහල නැංවීමේ අරමුණින් ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන ලද සිසු රැකුම ශිෂ්‍යාධාර වැඩසටහන යටතේ බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන කාර්යාලය විසින් 2012 සිට 2015 වර්ෂය දක්වා ශිෂ්‍යාධාර ගෙවීම සඳහා බැංකු වෙත යවන ලද මුදලින් රු. 100,500 ක් සාවද්‍ය ගිණුම් අංක සඳහන් කිරීම මත ආපසු එවා තිබුණි. එම ශිෂ්‍යාධාර මුදල් නිරවුල් නොකර 2015 දෙසැම්බර් 08 දින දක්වා බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඈ) 2015 වර්ෂය හා ඊට පෙර වර්ෂ වලදී බ/රත්කරව්ව මහා විද්‍යාලයට ගුණාත්මක යෙදවුම් සඳහා වැලිමඩ කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ලැබී තිබූ මුදලින් 2015 දෙසැම්බර් 31 දිනට රු. 310,686 ක ශේෂයක් පැවතුනි.

(ඉ) ඌව පළාතේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන සඳහා වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් සලසන ලද රු. 26,000,000 ක ප්‍රතිපාදනයෙන් එකතුව රු.1,255,175 ක් වැඩසටහනේ අරමුණුවලින් බැහැරව ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, සංස්කෘතික, සමාජ සුභසාධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් සංග්‍රහ කටයුතු සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම් සඳහා වැයකර තිබුණි.

(ඊ) විශේෂ ග්‍රාමීය සංචාර හා ඉතා දිළිඳු පවුල් නඟා සිටුවීමේ වැඩසටහන සඳහා සලසා ගෙන තිබූ රු. 15,000,000 ක ප්‍රතිපාදනයෙන් රු. 2,421,163 ක් අරමුණින් බැහැරව ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, සංස්කෘතික, සමාජ සුභසාධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් සංග්‍රහ සහ උත්සව කටයුතු සඳහා වැයකර තිබුණි.

(උ) 2015 වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් පසුගාමී හා හුදකලා ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වැය විෂයය අංක 704-3-7-2502(12) යටතේ රු. 68,000,000 ක හා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු. 92,766,142 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර, ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, සංස්කෘතික, සමාජ සුභසාධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනිව පාසල් වල අළුත්වැඩියා කටයුතු සහ උපකරණ මිලදී ගැනීම සඳහා රු. 9,347,729 ක් වැයකර තිබුණි.

6.8 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මො/කැන්දව්න්න මහා විද්‍යාලයේ ඉගෙනුම් මධ්‍යස්ථානය වෙනුවෙන් රු. 364,506 ක මුදලක් වැය කර 2009 වර්ෂයේ දී ලබාදී තිබූ පරිගණක උපාංග එම මධ්‍යස්ථානයේ විදුලි සැපයුම විසන්ධි කර තිබීම නිසා 2015 නොවැම්බර් 25 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) මොනරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සතු වාහන 06 ක් 2012 වර්ෂයේ සිට අළුත් වැඩියා කිරීමෙන් තොරව නිෂ්කාර්යව විවිධ ස්ථානවල ගාල්කර තිබුණි.

(ඇ) මොනරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් නිල නිවාස 03 ක් දීර්ඝ කාලයක් තිස්සේ අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් භාවිතයෙන් ඉවත්කර තිබුණි.

(ඈ) බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයට අයත් පාසැල් 35 ක ගුරු හා විදුහල්පති නිවාස පදිංචිය සඳහා භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුනි.

(ඉ) වැලිමඩ අධ්‍යාපන කලාපයට අයත් පාසැල්වල ගුරු නිවාස 42 ක් පදිංචිය සඳහා හැර වෙනත් අධ්‍යාපනික කාර්යයන් සඳහා යොදවා ගෙන තිබූ අතර, ගුරු නිවාස 06 ක් පදිංචිය සඳහා යොදා නොගෙන වසා දමා තිබුණි. ගුරු නිවාස 09 ක් පදිංචිය සඳහා නුසුදුසු අබලන් තත්ත්වයේ පැවතුනි.

6.9 හඳුනාගන්නා ලද පාඩු
------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන කාර්යාලය විසින් පාසැල් අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් සේවකයන් 04 දෙනෙකු ස්ථිර කර හිඟ වැටුප් ගෙවීමේදී එකතුව රු. 288,439 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල විදේශ පුහුණු පාඨමාලාවක පාඨමාලා ගාස්තු ලෙස ඇමරිකන් ඩොලර් 88,200 කට සරිලන මුදලක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය විසින් තායිලන්තයේ ආසියානු තාක්ෂණික ආයතනය වෙත ගෙවා තිබුණු අතර, ඇමරිකන් ඩොලර් 22,400 ක් වටිනා පාඨමාලා සඳහා පමණක් නිලධාරීන් සහභාගි කර තිබුණි. ඒ අනුව ඇමරිකන් ඩොලර් 65,800 කට සරිලන රු.8,685,600 ක මුදලක් තායිලන්ත ආසියානු තාක්ෂණ ආයතනයට වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ තාවකාලික රියදුරෙකුගේ පෞද්ගලික කටයුත්තක් සඳහා කැබ් රථයක් ධාවනය කිරීමේදී 2015 මැයි 15 දින අනතුරටපත් වීමෙන් සිදුවී ඇති රු. 1,953,001 ක ඇස්තමේන්තුගත අලාභය සම්බන්ධයෙන් ඌව පළාත් සභා මුදල් රීති 103.6 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. අනතුර සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට 2015 දෙසැම්බර් 07 දින දක්වාම කටයුතු කර නොතිබුණු අතර, පොලිස් පැමිණිල්ලේ පිටපත, ස්ථානීය පරීක්ෂණ වාර්තාව හා අධිකරන ක්‍රියාමාර්ග වලට අදාළ ලිපිගොනු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) මොනරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සිදු වූ රු. 1,828,647 ක වාහන අනතුරු 05 ක් සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

6.10 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු
-----------------------------------
පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇටම්පිටිය ජල යෝජනා ක්‍රමය
---------------------------------
හුදකලා ගම්මාන සංවර්ධන විශේෂ ව්‍යාපෘතිය යටතේ ඇටම්පිටිය ජල යෝජනා ක්‍රමය සඳහා හාලිඇල ප්‍රාදේශීය සභාව විසින් රු. 1,820,575 ක ගිවිසුමකට එළඹ තිබුණි. අනුමත ඇස්තමේන්තුව අනුව ටැංකියට ජලය ගෙන යන 1" ප්‍රමාණයේ ජලනල Type 1000 ප්‍රමාණයේ විය යුතු වුවද, මීටර් 100 ක ප්‍රමාණයක් Type 600 ප්‍රමාණයෙන් සවිකර තිබූ අතර මීටර් 26.5 ක ප්‍රමාණයක ජලනල පොළොවට යටකර නොතිබුණි.

(ආ) දොඩම්ගොල්ල ජල යෝජනා ක්‍රමය
--------------------------------------
හුදකලා ගම්මාන සංවර්ධන විශේෂ ව්‍යාපෘතිය යටතේ දොඩම්ගොල්ල ජල යෝජනා ක්‍රමය සඳහා ඇල්ල ප්‍රාදේශීය සභාව විසින් රු. 1,997,887 ක ගිවිසුමකට එළඹ තිබුණි. 2015 පෙබරවාරි 06 දිනට පෙර ව්‍යාපෘතියේ ඉදිකිරීම් නිමකල යුතු වුවද, 2015 ඔක්තෝබර් 08 දින වන විටත් වැඩ අවසන් කර නොතිබූ අතර ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශක්‍යතා වාර්තාවක්ද ලබාගෙන නොතිබුණි.

(ඇ) මො/අමුණේකදුර මහා විද්‍යාලයේ කෘෂිකර්ම ක්‍රියාකාරකම් ගොඩනැගිල්ල ඉදිකිරීම

මො/අමුණේකදුර මහා විද්‍යාලයේ කෘෂිකර්ම ක්‍රියාකාරකම් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් රු. 2,374,049 ක ගිවිසුමකට එළඹ තිබූ අතර, 2016 පෙබරවාරි 16 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

i. ජනෙල් සවිකිරීම සඳහා රු. 126,651 ක් ගෙවා තිබුණ ද, ජනෙල් රාමු සහ බිත්තිය අතර විවිධ ස්ථාන වල මිලි මීටර් 06 ක පමණ ප්‍රමාණයේ පරතරයක් පැවතුණි.

ii. දොරවල් සවි කිරීම සඳහා රු. 110,055 ක් ගෙවා තිබුණ ද, දොර උළුවහු සහ බිත්තිය අතර විවිධ ස්ථානවල මිලිමීටර් 06-08 ක පමණ පරතරයක් පැවතුණි.

iii. සපයා තිබූ උපකරණ වල සැකැස්ම සම්බන්ධයෙන් පිරිවිතර සකස්කර නොතිබුණි.

iv. නැතිතලා භූමියක අඩි 10 ක් පමණ ගැඹුරට පස් කපා ඉවත් කර ගෙපොල සකස් කර ගොඩනැගිල්ල ඉදිකර තිබූ අතර, එසේ ගෙපොල කැපීම නිසා බෑවුම් සහිත කොටස නාය යාමට ලක්වී තිබුණි.

(ඈ) බ/ඔරුබැදිවැව මහා විද්‍යාලයේ සෞන්දර්ය ඒකකය අළුත්වැඩියා කිරීම

බ/ඔරුබැදිවැව මහා විද්‍යාලයේ සෞන්දර්ය ඒකකය අළුත්වැඩියා කිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් 2015 ජුනි 10 දින රු.1,226,229 ක ගිවිසුමකට එළඹ තිබූ අතර, දොරවල් සපයා සවිකිරීම හා තීන්ත ආලේප කිරීම සඳහා රු. 115,600 ක් හා ජනෙල් සවිකිරීම හා තීන්ත ආලේප කිරීම සඳහා රු. 19,394 ක් ද ගෙවා තිබුණි. දොරවල් සහ ජනෙල් නිමාව සතුටුදායක තත්ත්වයේ නොපැවති බව හා එනමල් තීන්ත ආලේප කිරීම වෙනුවට වාර්නිෂ් ආලේප කර තිබූ බව 2016 පෙබරවාරි 15 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඉ) මො/මදුරුකැටිය ප්‍රාථමික විද්‍යාලයේ විද්‍යාගාරය ඉදිකිරීම

මො/මදුරුකැටිය ප්‍රාථමික විද්‍යාලයේ විද්‍යාගාරය ඉදිකිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් 2015 මැයි 05 දින රු. 2,366,511 ක ගිවිසුමකට එළඹ තිබුණි. 2015 ඔක්තෝබර් 15 දින වන විට කර්මාන්තයේ සියළුම වැඩ නිමකල යුතු වුවද, 2016 පෙබරවාරි 16 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. ප්‍රමාද කාලය වෙනුවෙන් ගිවිසුම ප්‍රකාරව අයකර ගතයුතු රු. 1,401,906 ක ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අයකරගෙන නොතිබුණි.

(ඊ) බ/මරංගහවෙල විද්‍යාලයේ පාසැල් ගොඩනැගිල්ල ඉදිකිරීම

බ/මරංගහවෙල විද්‍යාලයේ පාසැල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් 2015 මැයි 15 දින රු. 3,027,248 ක ගිවිසුමකට එළඹ තිබූ අතර, 2016 පෙබරවාරි 17 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පහත දැක්වේ.

i. 2015 අගෝස්තු 05 දින වන විට වැඩ නිමකල යුතු වුවද, පරීක්ෂණ අවස්ථාව වන විටත් සමහර වැඩ කොටස් ඉටුකර නොතිබුණි.

ii. ඉදිකිරීම් වැඩබිම සඳහා සපයා ගෙන තිබූ වැලි නියමිත ප්‍රමිතියෙන් නොතිබුණි.

iii. වැඩබිම සඳහා පාසැලෙන් අනවසර තාවකාලික විදුලි සැපයුමක් ලබාගෙන තිබුණි.

iv. ගොඩනැගිල්ලේ පිටුපස කොටස ගෙපොල කපා මට්ටම් කර නොතිබුණි. කපා ඉවත්කරන ලද පස් ගොඩනැගිල්ල ඉදිරිපසට දැමීම නිසා සෝදායාමට ලක්වී තිබු අතර, ඉදිරි කාලයේදී ගොඩනැගිල්ලට සිදුවිය හැකි හානි සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

v. සවිකර තිබු විදුලි පංකා 10 ක් සඳහා භූගත වයර් සවිකර නොතිබුණි.

(උ) බ/උදයරාජ මහා විද්‍යාලයේ පරිගණක විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම
---------------------------------------------------------------------------- ---

බ/උදයරාජ මහා විද්‍යාලයේ පරිගණක විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් 2015 මැයි 06 දින රු.2,263,140 ක ගිවිසුමකට එළඹ තිබු අතර, 2016 පෙබරවාරි 18 දින සිදුකරන ලද භෞතික පරික්ෂාවේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

i. ඉදිකරන ලද ගොඩනැගිල්ලේ වහලය යාබද ගොඩනැගිල්ලේ වහලය සමඟ එකිනෙකට සමීපව තිබු බැවින් මීටර් 12 ක් දිගට ශක්තිමත් ලී වලින් සකස් කළ වැහි පිහිලි සවිකිරීම සඳහා අතිරේක වැඩ යටතේ රු.93,000 ක් ගෙවා තිබුණි. ඇස්තමේන්තු සකස් කිරීමේදී හා ඉදිකිරීමේදී යෝජිත භූමිය නිසිපරිදි හඳුනා නොගැනීම නිසා මේ ආකාරයට අතිරේක වියදමක් දැරීමට සිදුවී තිබුණි.

ii. සවි කරන ලද ජනෙල් රාමු හා බිත්තිය අතර විවිධ ස්ථාන වල මිලිමීටර් 05 ක පමණ පරතරයක් පැවතුනි.

6.11 කාර්ය මණ්ඩල පරිපාලනය
------------------------------

6.11.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව
-------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

(අ) පළාත් සභා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා කාර්යාල
-----------------------------------------------------

| | සේවක වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1304 | 893 | 411 | - |
| (ii) | තෘතියික මට්ටම | 3257 | 2714 | 543 | - |
| (iii) | ද්විතියික මට්ටම | 21751 | 21220 | 531 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 5959 | 7067 | - | 1108 |
| (v) | වෙනත්(අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 1237 | - | 1237 |
| | එකතුව | 32271 | 33131 | 1485 | 2345 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 411 ක, තෘතියික මට්ටමේ තනතුරු 543 ක හා ද්විතියික මට්ටමේ තනතුරු 531 ක් වශයෙන් පුරප්පාඩු 1485 ක් පැවතුනි.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාථමික මට්ටමේ සේවකයින් 1108 ක් හා වෙනත් අනියම් සේවකයින් 1237 ක් අතිරික්ත සේවයේ යොදවා ගෙන තිබුණු අතර එම බඳවා ගැනීම් සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ආ) පාසල් කාර්ය මණ්ඩලය

| සේවක වර්ගය | | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| (i) | විදුහල්පතිවරුන් | 1011 | 601 | 410 | - |
| (ii) | ගුරුභවතුන් | 16334 | 17947 | - | 1613 |
| (iii) | සහය කාර්ය මණ්ඩලය | 622 | 1382 | - | 760 |
| | එකතුව | 17967 | 19930 | 410 | 2373 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට විදුහල්පති තනතුරුවල පුරප්පාඩු 410 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට ගුරු සේවයට 1613 ක් හා සහාය කාර්ය මණ්ඩලයට 760 ක් ද වශයෙන් 2373 දෙනෙකු අතිරික්ත සේවයේ යොදවා ගෙන තිබුණ ද, ඊට විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

6.11.2 අධ්‍යාපනය හා සම්බන්ධ කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බදුල්ල අධ්‍යාපන කලාපයේ පාසල් 07 ක කිසිදු කාල පරිච්ඡේදයක් ආවරණය නොකරන ගුරුභවතුන් 31 දෙනෙකු වෙනත් පාසල් වලට අනුයුක්ත කළ ගුරු භවතුන් 08 දෙනෙකු හා ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රාජකාරි සඳහා අනුයුක්ත කරන ලද ගුරුභවතුන් 08 දෙනෙකු සේවය කරමින් තිබුණි.

(ආ) බ/ලුණුගල මධ්‍ය මහා විද්‍යාලයේ වැටුප් ලැයිස්තුවෙන් වැටුප් ලබන ගුරුවරුන් තිදෙනෙකු වෙනත් පාසැල් වලට අනුයුක්ත කර තිබුණි.

(ඇ) මහියංගනය අධ්‍යාපන කලාපයට අයත් පාසැල් 40 ක වැඩ බලන විදුහල්පතිවරුන් ලෙස ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුභවතුන් පත්කර තිබූ අතර, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් 08 දෙනෙකු වෙනත් පාසල්වල විෂය ආවරණ කටයුතු සඳහා යොදවා තිබුණි.

(ඈ) පාසැල් කාර්ය සහායක හා පාසැල් කම්කරු සේවකයන් 04 දෙනෙකු අදාළ පාසැල්වල සේවය සඳහා යෙදවීමකින් තොරව මහියංගනය කලාප කාර්යාලයට අනුයුක්ත කර තිබුණි.

(ඉ) මහියංගන අධ්‍යාපන කලාපයේ පාසැල් 09 ක වැටුප් ලැයිස්තුවලින් වැටුප් ලබන ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුභවතුන් 09 දෙනෙකු වෙනත් පාසැල්වලට හා ජාතික පාසැල් වලට අනුයුක්ත කර තිබුණි.

(ඊ) බදුල්ල අධ්‍යාපන කලාපයේ වෙනත් පාසැල්වලින් හා වෙනත් අධ්‍යාපන කලාපවලට අයත් පාසැල්වල වැටුප් ලැයිස්තුවලින් වැටුප් ලබන ගුරුභවතුන් 21 දෙනෙකු බදුල්ල අධ්‍යාපන කලාපයේ නගර බද පාසැල් 12 කට අනුයුක්ත කර තිබුණි. එයින් 14 දෙනෙකු කිසිදු විෂය කාලපරිච්ඡේදයක් ආවරණය කර නොතිබු අතර, ගුරු භවතුන් දෙදෙනෙකු ජාතික පාසල් වලට අනුයුක්ත කර තිබුණි.

(උ) ඇල්ල කොට්ඨාශයට අයත් පාසල් 04 ක් 2015 වර්ෂය තුළදී අධීක්ෂණය කර නොතිබූ අතර, පාසල් 22 ක් අවම වශයෙන් පාසල් වාරයකට එක් වතාවක් බැගින් හෝ අධීක්ෂණය කර නොතිබුණි.

(ඌ) බ/රත්කරව්ව මහා විද්‍යාලයට වෙනත් පාසල් වලින් වැටුප් ලබන ගුරු භවතුන් තිදෙනෙකු අනුයුක්ත කර තිබූ අතර, එම විද්‍යාලයේ වැටුප් ලේඛනයෙන් වැටුප් ලබන ගුරු භවතුන් දෙදෙනෙකු වෙනත් පාසල්වලට අනුයුක්ත කර තිබුණි.

(එ) බ/බෝගහකුඹුර මහා විද්‍යාලයේ වැටුප් ලබන කාර්ය මණ්ඩලයට අයත් ගුරුභවතුන් තිදෙනෙකු පිළිවෙලින් වැලිමඩ කලාප අධ්‍යාපන කාර්යාලයට, වංගියකුඹුර ජාතික පාසලට හා ඌව පළාත් සභාවේ මන්ත්‍රීවරියකගේ කාර්ය මණ්ඩලයට අනුයුක්ත කර තිබූ අතර, වෙනත් පාසැල්වලින් වැටුප් ලබන ගුරුභවතුන් තිදෙනෙකු බ/බෝගහකුඹුර මහා විද්‍යාලයට අනුයුක්ත කර ප්‍රමාණවත් කාල පරිච්ඡේද සංඛ්‍යාවක් ආවරණය කිරීම සඳහා යොදවාගෙන නොතිබුණි.

(ඒ) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2003 නොවැම්බර් 07 දිනැති අංක 2003/38 දරන චක්‍රලේඛය ප්‍රකාරව ගුරුභවතකු සතියකට විනාඩි 40 කාල පරිච්ඡේද 35 ක් ඉගැන්විය යුතු වුවද, බ/ වැලිමඩ විජය විද්‍යාලයේ ගුරුභවතුන් 10 දෙනෙකු කාල පරිච්ඡේද 04-19 දක්වා ප්‍රමාණයක් ආවරණය කරමින් හා ගුරුභවතුන් දෙදෙනෙකු කිසිදු කාල පරිච්ඡේදයක් ආවරණය කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඔ) බ/වැලිමඩ විජය විද්‍යාලයේ වැටුප් ලබන කාර්ය මණ්ඩලයට අයත් ගුරුභවතුන් දෙනෙකු වෙනත් පාසැල් වලට අනුයුක්ත කර තිබූ අතර, වෙනත් පාසල් වලින් වැටුප් ලබන ගුරු භවතුන් තිදෙනෙකු බ/වැලිමඩ විජය විද්‍යාලයට අනුයුක්ත කර තිබුණි.

(ඕ) පස්සර අධ්‍යාපන කලාපයේ පාසැල් 33 ක විදුහල්පති තනතුරු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුභවතුන් වැඩ බැලීමේ පදනමින් පත්කර තිබුණි.

(ක) මොනරාගල අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසල් 10 ක විදුහල්පති ශ්‍රේණියේ ගුරුභවතුන් 11 දෙනෙකු ගුරු සේවයේ රාජකාරි සඳහා යොදවා තිබියදී පාසල් 53 ක විදුහල්පති තනතුර සඳහා ගුරු ශ්‍රේණිවල ගුරුභවතුන් පත්කර තිබුණි.

(ග) මැදගම අධ්‍යාපන කලාපයට අයත් පාසැල් වල ගුරුභවතුන් 42 දෙනෙකු දීර්ඝ කාලය සිට අතිරික්තව සේවයේ යෙදී සිටින බව අනාවරණය විය.

6.11.3 අනෙකුත් කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------------------

(අ) පශු වෛද්‍ය නිලධාරීන් 07 දෙනෙකුගේ හිඟයක් පැවතියදී සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ 2015 ජුලි 17 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරව පශු වෛද්‍ය නිලධාරිනියකට ගබඩා තොග හා අනෙකුත් කාර්යාලීය රාජකාරී පවරා තිබුණි.

(ආ) ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ 2007 අප්‍රේල් 25 දිනැති ලිපිය මඟින් ප්‍රාථමික ගුරු තනතුරකට පත් කරන ලද නිලධාරියෙකු 2007 ජුනි 06 දින සිට 2015 නොවැම්බර් 05 දින දක්වා ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට අනුයුක්ත කර කළමනාකරණ සහකාර සේවයේ රාජකාරි පවරා එම කාලය තුළ වැටුප් හා දීමනා වශයෙන් රු. 2,038,011 ක් ගෙවා තිබුණි. ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරියකුට වෘත්තීය විෂය ක්ෂේත්‍රය තුළ ලබාදෙන ගුරු පුහුණු වැඩසටහන් වලට සහභාගිවීම සඳහා මෙම නිලධාරියාට රාජකාරි නිවාඩු අනුමත කර තිබුණු අතර, " පුහුණු උපගුරු තනතුරකට උසස් වීමක්ද" ප්‍රදානය කර තිබුණි.

(ඇ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලයේ අතිරික්ත සංවර්ධන නිලධාරීන් 10 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා රු. 2,163,480 ක වැටුප් ගෙවා තිබුණි.

(ඈ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලයේ හිටපු නියෝජ්‍ය ප්‍රධාන ලේකම් වරයකු 2014 ඔක්තෝබර් 29 දින සිට කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කර්මාන්ත ප්‍රවාහන හා සංචාරක කටයුතු අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර තිබු නමුත් 2015 වර්ෂය සඳහා වැටුප් වශයෙන් රු. 1,113,208 ක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලයෙන් ගෙවා තිබුණි.

(ඉ) සහකාර නිවාස පාලිකා තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට පටහැනිව බිබිල සෙවන ළමා නිවාසයේ සහකාර නිවාස පාලිකා තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත පාලිකාවක බඳවා ගෙන 2013 ඔක්තෝබර් 01 දින සිට ඇය සහකාර නිවාස පාලිකා (iii) ශ්‍රේණියට පත්කර 2014 ජනවාරි සිට 2015 ජූලි මස දක්වා වැටුප් වශයෙන් රු.403,138 ක් ගෙවා තිබුණි.

6.12 වාහන උපයෝජනය

-----------------------

(අ) සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ වනිතා කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් 2014 සැප්තැම්බර් සිට 2015 ජූලි දක්වා සිය නිල වාහනය වෙනුවෙන් මසකට ඉන්ධන ලීටර් 170 ක් සඳහා මාසික ඉන්ධන දීමනාව ලබාගෙන තිබුණද, අදාල ඉන්ධන භාවිතා කොට නිල වාහනය ධාවන කටයුතු සඳහා යොදා ගෙන නොතිබුණි. 2006 ජුලි 11 දිනැති අංක 11/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව නිල වාහනයක් හිමි නිලධාරියෙකු සංචිත වාහන භාවිතා නොකළ යුතු වුවද, මෙම නිලධාරියා සංචිත වාහන පරිහරණය කර ඒ වෙනුවෙන් රු. 344,856 ක් වටිනා ඉන්ධන ලීටර් 3384.25 ක් භාවිතා කර තිබුණි.

(ආ) 2014 ජනවාරි 01 දිනැති අංක 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සාමාන්‍ය පෙට්‍රල් සහ ඩීසල් මිල ගණන් මත රජයේ නිලධාරීන් සඳහා ඉන්ධන දීමනා ලබාදිය යුතු වුවද, 2014 ජනවාරි 01 දින සිට 2015 ජුලි 31 දින දක්වා සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ වනිතා කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත රු.30,430 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) මොනරාගල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් අංක 53-1518 දරන කැබ් රථය වෙනුවෙන් 2014 මාර්තු සිට 2015 ජූලි දක්වා ඉන්ධන ඇනවුම් 06 ක් මඟින් ලබා ගත් රු. 18,368 ක් වටිනා ඉන්ධන ලීටර් 160 ක් එම කැබ් රථයේ ධාවන සටහන් වලට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) 2006 ජුලි 11 දිනැති අංක 11/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව නිල වාහනයක් හිමි නිලධාරියෙකු සංචිත වාහන භාවිතා නොකළ යුතු වුවද මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිල වාහනයට අමතරව සංචිත වාහන පරිහරණය කර 2015 ජනවාරි සිට ජුලි දක්වා රු.110,200 ක් වටිනා ඉන්ධන ලීටර් 1160 ක් භාවිතා කර තිබුණි. තවද එකම දිනය තුළ නිල වාහනය මෙන්ම සංචිත වාහනයද පරිහරණය කර තිබු බව විගණනයේදී අනාවරනය විය.

6.13 පළාත් පාලන ආයතන අධීක්ෂණය

6.13.1 හිඟ ආදායම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ඌව පළාතේ පළාත් පාලන ආයතන වල වරිපනම් බදු හා වෙනත් හිඟ ආදායම් එකතුව රු. 346,438,045 ක් විය.

(ආ) 1979 අංක 42 දරන මහ නගර සභා හා නගර සභා (සංශෝධිත) පනතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පළාත් පාලන ආයතන වලට අය විය යුතු උසාවි දඩ රු. 65,725,453 ක් හා මුද්දර ගාස්තු රු. 79,233,274 ක් අදාල බලධාරීන්ගෙන් පළාත් පාලන ආයතන වලට ලැබී නොතිබුණි.

6.13.2 නිකුත් කර තිබුණු අධිභාර සහතික වෙනුවෙන් අයවීමට ඇති මුදල්

සමාලෝචිත වර්ෂය අවසානයට ඌව පළාතේ පළාත් පාලන බල මණ්ඩලවල නිලධාරීන්ට හා නියෝජිතයින්ට පනවා තිබුණු අධිභාර වෙනුවෙන් රු. 6,852,700 ක් අය වීමට තිබුණි.

7. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

7.1 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පළාත් සභාව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

7.2 අභ්‍යන්තර විගණනය

7.2.1 පළාත් සභාවට අයත් ආයතන 53 ක් සම්බන්ධයෙන් 2015 වර්ෂය තුළදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, ආයතන 30 ක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද අභ්‍යන්තර විගණනයන්ට අදාළ වාර්තා නිකුත් කර නොතිබුණි.

7.2.2 සමාලෝචිත වර්ෂය සඳහා පහත සඳහන් ආයතනවල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(අ) ඌව ආණ්ඩුකාරවර කාර්යාලය.
(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
(ඇ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය
(ඈ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය
(ඉ) පළාත් පාලන ආයතන
(ඊ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල
(උ) මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව.
(ඌ) ආයුර්වේද රෝහල් 06 ක්, මධ්‍යම බෙහෙත් ශාලා 19 ක් සහ ඖෂධ උයන් 01 ක්
(එ) මූලික රෝහල් , දිස්ත්‍රික් රෝහල්, මධ්‍යම බෙහෙත් ශාලා හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල.

7.3 විගණන හා කළමනාකරණ කමිටු

7.3.1 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව ඌව පළාතේ පළාත් පාලන ආයතන, කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය, ඌව පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව සහ බදුල්ල හා මොනරාගල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල යන ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

7.3.2 2015 වර්ෂය තුළදී පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු වලදී ගන්නා ලද තීරණ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

7.4 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පළාත් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

7.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

පසුගිය වර්ෂයන්හි ඌව පළාත් සභාවේ මුල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාව ඉදිරියේ තැබීමේ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාව නිකුත් කළ දිනය | වාර්තාව සභාගත කළ දිනය |
|---|---|---|
| 2008 | 2010.08.31 | 2011.01.20 |
| 2009 | 2011.08.27 | 2011.10.13 |
| 2010 | 2012.09.12 | 2012.12.13 |
| 2011 | 2014.02.11 | 2014.06.19 |
| 2012 | 2014.08.27 | 2015.04.23 |
| 2013 | 2015.02.10 | 2016.04.28 |
| 2014 | 2015.09.21 | 2016.07.14 |

7.6 අත්තිකාරම් ගිණුම්වල සීමාවන්

ඌව පළාත් සභාවේ කාර්යාල 04 ක රජයේ නිලධාරීන්ට ණය හා අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා වාර්ෂික විසර්ජන ප්‍රඥප්තියෙන් බලය දෙනු ලැබූ ලැබීම්වල අවම සීමාවන් සංශෝධනය කරගෙන නොතිබුණි.

| ආයතනයේ නම | විසර්ජන පනතින් බලය දෙනු ලැබූ ලැබීම්වල අවම සීමාව | තථ්‍ය ලැබීම් |
|---|---|---|
| | රු. | රු. |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලය | 1,400,000 | 3,246,975 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 700,000 | 1,897,979 |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය | 1,500,000 | 2,204,427 |
| ආණ්ඩුකාර වර කාර්යාලය | 800,000 | 1,705,114 |
| එකතුව | 4,400,000 | 9,054,495 |

8. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි පළාත් සභාව විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් කළමනාකරණය
(ඇ) පළාත් සභා සංවර්ධන සැලැස්ම
(ඈ) අභ්‍යන්තර පාලනය
(ඉ) පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය
(ඊ) සේවක මණ්ඩල කළමනාකරණය
(උ) වත්කම් කළමනාකරණය
(ඌ) කොන්ත්‍රාත් කළමනාකරණය
(එ) පළාත් ඉඩම් කළමනාකරණය